# ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය සභාව
# හම්බන්තොට දිස්ත්‍රික්කය

-----------------------------------

## 1 මූල්‍ය ප්‍රකාශන

## 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 30 දිනද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 29 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 සැප්තැම්බර් 26 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

## 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට ලුණුගම්වහෙර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත විස්තර දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) උපමාන පාදක සංවර්ධන ප්‍රදාන යටතේ බෙරලිහෙල ජනසවිගම මැද පාර සංවර්ධනය කිරීම සඳහා 2016 දෙසැම්බර් 28 දින රු. 520,640 කට ගිවිසුම්ගත වී තිබූ නමුත්, ඒ වෙනුවෙන් ණයගැති හා ණයහිමි ප්‍රතිපාදන ඇති කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී මිලදී ගෙන තිබූ රු. 146,030 ක් වූ ලැප්ටොප් පරිගණකයේ සහ පොත් රාක්ක 07 හි වටිනාකම ප්‍රාග්ධනිත කර නොතිබූ අතර, පරිත්‍යාග වශයෙන් ලද පුස්තකාල පොත්වල වටිනාකම රු.31,418 ක් අඩුවෙන් ප්‍රාග්ධනිත කර තිබුණි.

(ඇ) ඉදිකිරීම් කර්මාන්තයක් වෙනුවෙන් 2012 දී ගෙවා තිබූ රු. 293,563 ක් සඳහා සමාලෝචිත වර්ෂයේ ණයගැති ප්‍රතිපාදන සලසා තිබූ අතර, 2015 වර්ෂය තුළ ඉදිකිරීම් කර්මාන්තයක් වෙනුවෙන් ලැබී හා ගෙවා තිබූ රු. 27,706 ක් වෙනුවෙන් ණයගැති හා ණයහිමි ප්‍රතිපාදන ඇති කර තිබුණි.

**1.3.2 ලැබිය යුතු ගිණුම්**

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) දීර්ඝ කාලයක සිට අයවිය යුතුව පවතින රු. 82,200 ක් වූ භිඟ බලපත්‍ර ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සභාවේ සේවයේ නියුතු නිලධාරින්ට 2015 ජනවාරි මස පැවති ජනාධිපතිවරණ මැතිවරණ රාජකාරි වෙනුවෙන් ගෙවා තිබූ රු. 21,238 ක මුදල 2017 ජූලි 31 දින වන විටත් ප්‍රතිපූර්ණය කර ගෙන නොතිබුණි.

(ඇ) පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන - 2012 යටතේ මාර්ගයක් ඉදිකිරීම වෙනුවෙන් ලැබිය යුතුව තිබූ රු. 8,400 ක මුදල අයකර ගෙන නොතිබුණි.

(ඈ) 2009 නොවැම්බර් හා දෙසැම්බර් මාස වල ජීවන වියදම් දීමනා වශයෙන් පළාත් පාලන කොමසාරිස්ගෙන් අයවිය යුතුව තිබූ රු. 6,500 ක මුදල 2017 ජූලි 31 දින වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) වර්ෂ ගණනාවක සිට මූල්‍ය ප්‍රකාශන වල ඉදිරියට ගෙනෙමින් පවතින රු. 1,358 ක අත ඉතිරි මුදල් හා භිඟහිටි වෙනත් ආදායම් රු. 2,327 ක් නිරවුල් කර ගැනීමට සමාලෝචිත වර්ෂයේදීත් කටයුතු කර නොතිබුණි.

**1.3.3 නීති,රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම**

පහත දැක්වෙන නීති,රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීමේ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය කරනු ලැබේ.

| නීති රීති, රෙගුලාසි යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 (1) වගන්තිය | වරිපනම් බදු තක්සේරු කර අය කර ගැනීම කෙරෙහි සභාවේ අවධානය යොමු වී නොතිබුණි. |
| (ආ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති සංග්‍රහය | |
| i. රීති 185 | සභා කර්මාන්ත ගිණුමේ රු. 2,718,475 ක අතිරික්ත මාසික සාමාන්‍ය මුදල් ශේෂ ආයෝජනය කිරීමට කටයුතු කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| ii. | රීති 193 | අයවැයගත මූල්‍ය ප්‍රතිපාදන හා පරිපූරක සම්මත හා සමඟ සසඳා එක් එක් ආදායම් විෂයයන් හා වැය විෂයයන් යටතේ වන අතිරික්තයන් හෝ ඌණතාවන් පිළිබඳ කරුණු පැහැදිලි කරන ප්‍රකාශයක් ඉදිරිපත් කර නොතිබුණි. |

(ඈ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය
----------------------------

| | |
|---|---|
| මුදල් රෙගුලාසි 571(3) | 2005 සහ 2008 සිට 2014 දක්වා කාල පරිච්ඡේදයට අයත් එකතුව රු. 23,000 ක් වූ තැන්පත් ශේෂ 46 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඇ) | 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | 2016 වර්ෂයේදී සභාව සතු වාහන දහයක ඉන්ධන දහනය පරීක්ෂා කර නොතිබුණි. |

(ඉ) 2015 ඔක්තෝබර් 09 දිනැති අංක PFD/RED/2015/08 පොදු (i) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂවරයාගේ ලිපිය
----------------------------------

| | |
|---|---|
| 4.3(අ) සහ (ඉ) වගන්ති | සභාවේ සේවයේ සිට ස්ථාන මාරුවී ගිය නිලධාරියෙකුගෙන්, සේවය අතහැර ගිය හා විශ්‍රාම ගිය නිලධාරීන් තිදෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු. 8,741 ක ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු. 1,017,675 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදමට වඩා වැඩි වූ ආදායම රු. 61,925ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු. 955,751 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

## 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය
----------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ මුළු පුනරාවර්තන ආදායමින් සියයට 95 ක් තරම් ඉහළ අගයක පුනරාවර්තන වියදම් පැවති අතර, එය මූල්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් සතුටුදායක තත්ත්වයක් නොවන බව නිරීක්ෂණ විය.

(ආ) සෑම වර්ෂයකම ස්වයං උත්පාදන ආදායම් ඉක්මවා සැලකිය යුතු අගයන්ගෙන් පුනරාවර්තන වියදම් දරා ඇති බවත්, සමාලෝචිත වර්ෂයේදී එම අගය ස්වයං උත්පාදන ආදායම මෙන් තුන් ගුණයක් ඉක්මවා ඇති බවත් ආදායම් ආධාර නොලැබෙන්නට සභාවේ ආදායම් වලින් කිසිදු ආකාරයකින් පුනරාවර්තන වියදම් ආවරණය කර ගැනීමට නොහැකි තත්ත්වයක් උද්ගත වී ඇති බවත් වියදම් පාලනය කර ගැනීම කෙරෙහි සභාවේ අවධානය යොමුවී නොමැති බවත් පෙන්නුම් කෙරුණි.

## 2.3 කාරක ප්‍රාග්ධන කළමනාකරණය
----------------------------------

සමාලෝචිත වර්ෂයේ ජංගම අනුපාතය 1:1.27 ක් වූ අතර එය පසුගිය වසරට වඩා පිරිහීමක් පෙන්නුම් කෙරිණි.

## 2.4 ආදායම් පරිපාලනය
--------------------

### 2.4.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය
------------------------------------

සමාලෝචිත වර්ෂය තුළදී ආදායම් රැස්කිරීමේ ප්‍රගතිය පිළිබඳ පහත දැක්වෙන කරුණු නිරික්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයට අදාළව බිල්කළ මුළු පුනරාවර්තන ආදායම රු. මිලියන 50.85 ක් වූ අතර, එයින් රු.මිලියන 41.43 ක් රැස්කර තිබුණි. ඒ අනුව ආදායම් රැස්කිරීමේ ප්‍රගතිය සියයට 77 ක් විය.

(ආ) සමාලෝචිත වර්ෂය ආරම්භයට ලැබිය යුතු ආදායම් වල එකතුව රු. මිලියන 8.96 ක් වූ අතර, එයින් රු.මිලියන 8.38 ක් අයවී තිබුණි. ඒ අනුව හිඟ ආදායම් අය කිරීමේ ප්‍රගතිය සියයට 94 ක් පමණ විය.

### 2.4.2 කඩ කාමර කුලී
----------------

සභාවට අයත් කඩකාමර 19 කින් 2016 දෙසැම්බර් 31 දිනට රු. 64,810 ක කුලී හා රු. 6,400 ක ප්‍රමාද ගාස්තු අයවීමට තිබූ අතර, එම හිඟ මුදල් අයකර ගැනීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159(1) වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**2.4.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

----------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2016 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ වෙනුවෙන් රු. 251,845 ක් සහ මුද්දර ගාස්තු වෙනුවෙන් රු. 865,000 ක් ලැබිය යුතුව තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

-------------------------

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

-------------------------------

**3.1.1 වීථි පහන් නඩත්තුව**

-------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(ආ) වීථි ලාම්පු නඩත්තු කිරීම සම්බන්ධයෙන් ලේඛනයක් පිළියෙල කර නොතිබුණු බැවින් සභාව විසින් කොපමණ වීථි පහන් ප්‍රමාණයක් නඩත්තු කරන්නේද පරීක්ෂා කිරීමට නොහැකි විය.

(ආ) 2010 අගෝස්තු 17 දිනැති අංක පීඊ/01/01 දරන විදුලිබල හා බල ශක්ති අමාත්‍යාංශ චක්‍රලේඛයේ විධිවිධාන වලට අනුකූලව, සභා බල ප්‍රදේශය තුළ ස්ථාපනය කර ඇති වීථි පහන් පිළිබඳ ලංකා විදුලිබල මණ්ඩලය වෙත අයදුම් කර නීත්‍යානුකූල කර ගැනීම තුලින් අදාළ වියදම් ප්‍රතිපූර්ණය කරගත හැකි වුවද, ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි.

**3.1.2 කාර්ය මණ්ඩල කළමනාකරණය**

--------------------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කාර්ය මණ්ඩලයට අයත් තනතුරු 06 ක නවදෙනෙකුගේ පුරප්පාඩු සහ තනතුරු 03 ක තුන් දෙනෙකුගේ අතිරික්තයන් පැවතුණි. අතිරික්ත තනතුරු විධිමත් කර ගැනීමට මෙන්ම පුරප්පාඩු පුරවා ගැනීමට සභා විසින් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**3.2 වත්කම් කළමනාකරණය**

-------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) නිෂ්ක්‍රීය වත්කම්

--------------------

ආපදා කළමණාකරණ අමාත්‍යාංශයෙන් 2012 පෙබරවාරි 06 දින ලැබී තිබුණු කොන්ක්‍රීට් මිශ්‍රණ යන්ත්‍රය එදින සිට ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

(ආ) පවරා නොගත් වත්කම්

-------------------------

i. විවිධ රාජ්‍ය ආයතන වලින් 1993 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා සභාව වෙත ලැබී තිබුණු වාහන 12 ක අයිතිය 2017 ජූලි 30 දින වන විටත් සභාව වෙත පවරාගෙන නොතිබුණි.

ii. සභාව සතු සුසාන භූමි 14 ක වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.

**3.3 ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය**

**---------------------------------**

ඝන අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීයකරණ ව්‍යාපෘතියක් පවත්වා තිබුණු නමුත් පරිසර බලපත්‍රය ලබා ගැනීමට 2017 ජූලි 31 දක්වා කටයුතු කර නොතිබුණි.

**4. යහපාලනය සහ ගිණුම් කටයුතුභාවය**

**------------------------------------------**

**4.1 අයවැය පාලනය**

**-----------------**

වැය විෂයයන් 24 ක් සඳහා අයවැයගත රු. 817, 815 ක ප්‍රතිපාදන සම්පූර්ණයෙන්ම ඉතිරිවී තිබුණු අතර ආදායම් විෂයයන් 05 ක අහිතකර විචලනයන්ගේ එකතුව රු. 21,883,022 ක් විය. එම අගයයන් සියයට 24 සිට සියයට 59 ක් දක්වා පරාසයක වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමණාකරණ පාලන කාරකයක් වශයෙන් යොදා ගෙන නොතිබුණි.

**5. පද්ධති හා පාලන**

**--------------------**

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු විය යුතුය.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) සේවක මණ්ඩල කළමනාකරණය

(ඈ) අයවැය පාලනය